# GOVERNMENT

# &

# BUSINESS

# (Part-VI)


***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන

- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- මිණුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව
- මධ්‍යම පරිසර අධිකාරිය
- ප්‍රාදේශීය සෞඛ්‍යය වෛද්‍ය නිලධාරී කාර්යාලය
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ClassWork.LK

# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවීමේ අරමුණු

- පාරිභෝගිකයින්ගේ ජීවිත හා දේපළවලට උපද්‍රවයක් සිදු වන භාණ්ඩ අලෙවිය හා සේවා සැපයීමට එරෙහි ව ඔවුන් ආරක්ෂා කිරීම

- අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීම සහතික වීම

- හැකි සෑම විට ම පාරිභෝගිකයන්ට තරගකාරී මිලට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබා දීමට සහතික වීම

- අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්ඳන් විසින් සිදු කරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට සහනයක් ලබා දීම

ClassWorkLK

# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යයන්

- ව්‍යවසායන් අතර සීමාකාරී ගිවිසුම් පාලනය කිරීම හෝ ඉවත් කිරීම

- වෙළෙඳපොළ ඇතුළත හෝ වෙළෙඳපොළේ සැලකිය යුතු කොටසක දේශීය වෙළෙඳාමේ හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදා ගැනීම නැති කිරීම

- දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරඟකාරිත්වය පිළිබඳ අවහිරතා නැති කිරීම

- තරඟ විරෝධී චර්යා හා ආධිපත්‍ය තත්ත්ව අනිසි ලෙස යොදා ගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂා කිරීම

- භාණ්ඩ හා සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟකාරිත්වය පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම

- භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබා ගැනීමට හැකි වීම සහ ඒවායෙහි තත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් හා සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම

ClassWork.LK

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය

- අධිකාරිය විසින් නියම කර ඇති ප්‍රමිතියට අනුව නිෂ්පාදනය, සැපයීම, ගබඩා කිරීම, ප්‍රවාහනය හා විකිණීම සිදු කිරීම නිසා නාස්තිය අවම වී ලාභය වර්ධනය වීම

- පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යොමු වීම නිසා පාරිභෝගික විශ්වාසය දිනා ගැනීමට හැකි වීම

- වෙළෙඳ විෂමාචාරවලින් වැළකී කටයුතු කිරීමෙන් ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වීම

- ව්‍යාපාරිකයාට මුහුණ දීමට සිදු වන නෛතික තතත්වයන් අවම වීම
- ව්‍යාපාර අතර ඇති වන අනවශ්‍ය තරඟකාරිත්වය අවම වීම

- ඒකාධිකාරී තත්ත්වයන් ඇති නො වීම නිසා සාධාරණ ව තරඟ කළ හැකි වීම

ClassWork.LK

# ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු

- නිෂ්පාදන ක්‍රියාවලිය හා සැකසීම පිළිබඳ ව ජාතික හා අන්තර්ජාතික පදනම මත ප්‍රමිති පිළියෙල කිරීම
- කාර්මික හා වාණිජ ක්ෂේත්‍රවල ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා රසායනාගාර හා පුස්තකාල සේවා පිහිටුවා පවත්වා ගෙන යාම
- දේශීය නිෂ්පාදන මෙන් ම ආනයනය කරන ලද භාණ්ඩ ප්‍රමිතිවලට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම
- ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලන කටයුතු සඳහා පර්යේෂණ පහසුකම් සැපයීම
- ප්‍රමිති සහතික සලකුණු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
- ජාත්‍යන්තර ප්‍රමිති ආයතන හා ඒ සමාන කටයුතුවල යෙදෙන සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම

ClassWork.LK

- අධ්‍යාපනය, උපදේශනය හා වෙනත් මාර්ගවලින් ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන කටයුතු දිරිගැන්වීම

**<u>ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යයන්</u>**

- ප්‍රමිති පිළියෙල කිරීම
- ප්‍රමිති ක්‍රියාත්මක කිරීම
- ස්වේච්ඡාවෙන්
- SLS සහතික ලාංඡන ක්‍රමය මගින්
- පූර්ව අපනයන පරීක්ෂාව මගින්
- ආනයන පරීක්ෂාව මගින්
- අපනයන පිළිබඳ පිළියෙල කළ මුහුදු ආහාර පරීක්ෂාව මගින්
- ISO ප්‍රමිති ක්‍රියාත්මක කිරීම
- ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම

ClassWork.LK

- ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන ප්‍රවර්ධන කටයුතු

- උපකරණ ක්‍රමාංකන සේවා

- පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම

- පුස්තකාල සේවාව, දේශීය විදේශීය ප්‍රමිති අලෙවිය සහ තොරතුරු සේවා

- තත්ත්ව පද්ධති පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම

**<u>ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය</u>**

- SLS ලකුණ සහිත නිෂ්පාදිත අලෙවි කිරීම තුළින් තරඟකාරිත්වයට සාර්ථක ව මුහුණ දිය හැකි වීම

- SLS ලකුණ නො මැති නිෂ්පාදන ආයතන අභිබවා නියම වශයෙන් වාසිදායක තත්ත්වයක් ලැබිය හැකි වීම
- පාරිභෝගික පැමිණිලි අවම කර ගත හැකි වීම

Class Work.LK

- රාජ්‍ය අංශය SLS සලකුණ සහිත භාණ්ඩ මිල දී ගැනීමට ප්‍රමුඛත්වයක් දෙන බැවින් වෙළෙඳපොළ කොටස පුළුල් කර ගත හැකි වීම

- විදේශ සහතික කිරීමේ සලකුණු (ISO) ලබා ගැනීම තුළින් විදේශ වෙළෙඳපොළේ දී සාර්ථක වීමට ඉඩ ලැබීම

- ප්‍රමිතීන් තුළ පාරිභෝගික අවශ්‍යතා හා නෛතික අවශ්‍යතා ඇතුළත් වන බැවින් නිෂ්පාදිත පිළිබඳ පිළිගත හැකි මට්ටම ඉහළ යාම

- නාස්තිය අවම වී ඵලදායීතාව වර්ධනය වීම

- ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වී සේවක චිත්ත ධෛර්ය වර්ධනය වීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura